ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2294/52 - 2022 අගෝස්තු මස 25 වැනි බ්‍රහස්පතින්දා - 2022.08.25

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 21/1978 (X) (බී)

**1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනත**

25අ වන වගන්තිය සමඟ කියවිය යුතු 27(1)(ආ) වගන්තිය යටතේ වන නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25අ වන වගන්තිය සමඟ කියවිය යුතු 27(1)(ආ) වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අධ්‍යාපන අමාත්‍ය, ආචාර්ය ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත වන මා විසින්, 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාවේ සංස්ථාගත කර ඇති, ලියාපදිංචි අංක පී. බී. 4833 දරන සහ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් ලෙස පිළිගනු ලබන සමාගමක් වන නැෂනල් ස්කූල් ඔෆ් බිස්නස් මැනේජ්මන්ට් ලිමිටඩ් ආයතනය සම්බන්ධයෙන් ඉහත කී පනතේ 70ඇ වන වගන්තිය යටතේ වාර්තාවක් ලබා ගැනීමෙන් පසුව, මේ නියමය මගින්, එකී පනත යටතේ සාදන ලද සහ 2022 පෙබරවාරි මස 25 වැනි දින අංක 2268/87 දරන *අති විශෙෂ ගැසට්* පත්‍රයේ පළකරන ලද නියමයේ II වන උපලේඛනය, මෙහි I වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති කොන්දේසිවලට යටත්ව, එහි I වන තීරයේ දැක්වෙන ''දත්ත විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව'' යන සටහනට හා එහි II වන තීරයේ අනුරූප සටහනට ඉක්බිතිව ම, මෙහි II වන උපලේඛනයේ පිළිවෙලින් I වන සහ II වන තීරයන්හි නිශ්චිතව දක්වා ඇති සටහන් එකතු කිරීම මගින් මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

**I වන උපලේඛනය**

**කොන්දේසි**

1. නැෂනල් ස්කූල් ඔෆ් බිස්නස් මැනේජ්මන්ට් ලිමිටඩ් ආයතනය විසින්, කළමනාකරණය පිළිබඳ ආචාර්ය උපාධිය සම්බන්ධයෙන් මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති උපාධි පාඨමාලාව සඳහා සිසුන් ඇතුළත් කර ගැනීමේ දී -

(*අ*) කළමනාකරණය හෝ වෙනත් යම් සම්බන්ධිත ක්ෂේත්‍රයක දර්ශනපති උපාධියක් ලබා තිබීම; හෝ



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

(*ආ*) ශ්‍රී ලංකා යෝග්‍යතා මාර්ගෝපදේශ රාමුවේ 10 වන ස්ථරයේ (එස්එල්කිවුඑෆ් 10) දැක්වෙන අවශ්‍යතා සපුරාලනු ලබන මාස්ටර්ස් උපාධියක් හෝ කළමනාකරණය හෝ වෙනත් යම් සම්බන්ධිත ක්ෂේත්‍රයක දර්ශනපති උපාධියක් ලබා තිබීම,

යන ඇතුළත් කර ගැනීමේ අවම සුදුසුකම්වලට අනුකූලව කටයුතු කළ යුතු ය.

2. නිශ්චිත බලධරයා විසින් පවත්වනු ලබන පස් අවුරුදු (5) ප්‍රතිසමාලෝචනයකට යටත්ව මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති උපාධිය පිරිනැමීම සඳහා නැෂනල් ස්කූල් ඔෆ් බිස්නස් මැනේජ්මන්ට් ලිමිටඩ් ආයතනය පිළිගනු ලැබිය යුතු ය.

## II වන උපලේඛනය

| *I වන තීරය*<br>*උපාධිය* | *II වන තීරය*<br>*උපාධිය සඳහා වන කෙටි යෙදුම* |
|---|---|
| කළමනාකරණය පිළිබඳ ආචාර්ය | පී එච් ඩී (කළමනාකරණය) |

**ආචාර්ය ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත (පා.ම.),**
අධ්‍යාපන අමාත්‍ය.

2022 අගෝස්තු මස 10 වැනි දින,
කොළඹ දී ය.

EOG 08 - 0247

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.